සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10	ගණිතය - I	කාලය / நேரம் / Time	පැය 02යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- **A** කොටසෙහි සියලුම ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ද, **B** කොටසෙහි එක් ප්‍රශ්නයක නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 10 බැගින් ද හිමිවේ.


A කොටස

01. පාට පැන්සල් පෙට්ටි 3 ක මිල රු. 1530 නම් එවැනි පාට පැන්සල් පෙට්ටි 7 ක මිල සොයන්න.

02. දර්ශක ආකාරයෙන් දක්වන්න.

$\log_3 243 = 5$

03. දී ඇති රූපයේ $(A \cap B)'$ පෙදෙස අඳුරු කර දක්වන්න.




04. $9 - 4x^2$ හි සාධක සොයන්න.

05. $\sqrt{13}$ හි අගය කුමන අනුයාත පූර්ණ සංඛ්‍යා දෙක අතර පිහිටයිද ?

1) 9 හා 16 2) 3 හා 4 3) 4 හා 5

06. පහත රූපයේ x හි අගය සොයන්න.




07. පහත දත්ත වල මාතය හා මධ්‍යස්ථය සොයන්න.

1, 1, 1, 2, 2, 3, 4, 5, 6


Past Papers Wiki


08. ABC කේන්ද්‍රික ඛණ්ඩයේ පරිමිතිය 25 cm ද එහි චාප දිග 11 cm ද නම් අරය සොයන්න.




09. a^2b, ab^2c, abc^2 යන වීජීය පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

10. පහත දී ඇති ත්‍රිකෝණ අතුරින් අංගසම ත්‍රිකෝණ යුගලය තෝරා, අංගසම අවස්ථාව ද ලියා දක්වන්න.








11. සමබර ඝනකාකාර දාදු කැටයක මුහුණත් 6 හි 1, 1, 2, 2, 3, 3 ලෙස අංක කර ඇත. දාදු කැටය උඩ දැමූවිට ඔත්තේ සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

12. හරස්කඩ සමපාද ත්‍රිකෝණාකාර ප්‍රිස්මයක මුළු පෘෂ්ඨ වර්ගඵලය 180 cm^2 කි. මෙහි ත්‍රිකෝණාකාර මුහුණත් 2 හි වර්ගඵලය 60 cm^2 ක් වේ. සෘජුකෝණාස්‍රාකාර මුහුණතක වර්ගඵලය සොයන්න.



13. $\frac{1}{x} + \frac{1}{4x} - \frac{1}{3x}$ සුළු කරන්න.

14. පහත ප්‍රකාශන සත්‍ය නම් ඉදිරියෙන් ✓ ලකුණ ද, අසත්‍ය නම් ✗ ලකුණ ද ලියන්න.


සමාන්තරාස්‍රයක විකර්ණ මගින් ශීර්ෂ කෝණ සමච්ඡේදනය වේ.	
රොම්බසයක විකර්ණ දිගින් සමාන වේ.	
සමචතුරස්‍රයක විකර්ණ දිගින් සමාන වේ.	

15. පහත අසමානතාවය විසඳා විසඳුමෙහි කුඩාම ධන නිඛිලය ලියන්න.

$6x - 1 > 5$

---

16. O කේන්ද්‍රය වූ වෘත්තයෙහි $AB = 12\text{ cm}$ ද, $OC = 8\text{ cm}$ වේ නම් CD දිග සොයන්න.




---

17. $x(x - 2) = 0$ හි විසඳුම් සොයන්න.

---

18. AB රේඛාවේ, i) අනුක්‍රමණය

ii) අන්තඃඛණ්ඩය සොයන්න.




---


19. නිවසක වාර්ෂික තක්සේරු වටිනාකම රු. 36 000 ද, වාර්ෂික වරිපනම් බදු ප්‍රතිශතය 10% වේ නම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු වරිපනම් බදු මුදල සොයන්න.

---

20. දී ඇති තොරතුරු භාවිතා කර x හි අගය සොයන්න.




21. වෘත්තයේ කේන්ද්‍රය O වේ. දී ඇති තොරතුරු අනුව y හි අගය සොයන්න.




---

22. රූපයේ දැක්වෙන්නේ අරය 21 cm ද, දිග 1 m ද වන සිලින්ඩරාකාර රෝලකි. එය එක් වටයක් පෙරළීමේ දී තැලෙන බිම් ප්‍රමාණය සොයන්න.




---

23. රූපයේ දී ඇති තොරතුරු අනුව a හි අගය සොයන්න.




---

24. AB ප්‍රදීපාගාරයේ මුදුන B වේ. C හා D මුහුදේ ඇති බෝට්ටු දෙකකි. C බෝට්ටුවේ සිටින අයෙකුට B මුදුන පෙනෙනුයේ 60^0 ක ආරෝහණ කෝණයකිනි. B හි සිටින අයෙකුට D බෝට්ටුව පෙනෙනුයේ 35^0 ක අවරෝහණ කෝණයකිනි. තොරතුරු රූපයේ ලකුණු කරන්න. (නිරීක්ෂකගේ උස නොසලකන්න.)



---

25. රූපයේ PSR යනු Q ලක්ෂ්‍යයකට නියත දුරින් චලනය වන ලක්ෂ්‍යයක පථය වේ. එම පථය මත QP ට හා QR ට සමදුරින් වන X ලක්ෂ්‍යය, පථ පිළිබඳ දැනුම භාවිතයෙන් ලකුණු කරන්න.



B කොටස

- **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයෙහි ම පිළිතුරු සපයන්න.**

01. ඉඩමකින් $\frac{1}{2}$ ක් වට්ටක්කා වගාකර ඇති අතර $\frac{1}{5}$ ක් වම්බටු වගාකර ඇත.

i) වට්ටක්කා හා වම්බටු වගාකර ඇති බිම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර භාගයක්ද ? (ල. 02)

ii) ඉතිරියෙන් $\frac{1}{3}$ ක බිම් ප්‍රමාණයක මිරිස් වගාකර ඇති නම් මිරිස් වගාකර ඇති බිම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර භාගයක්ද ? (ල. 02)


iii) ඉතිරි බිම් ප්‍රමාණය $300\,m^2$ ක් නම් මුළු ඉඩම් ප්‍රමාණය වර්ගමීටර කීයද ? (ල. 04)

iv) $1\,m^2$ ට පැල 4 ක් බැගින් සිටුවා ඇත්නම්, වගා බිමේ ඇති මිරිස් පැල ගණන සොයන්න. (ල. 02)

මුළු ලකුණු 10

---

02. රූපයේ දැක්වෙන්නේ බිත්ති සැරසිල්ලක් සඳහා යොදාගන්නා සමචතුරස්‍රාකාර ආකෘතියකි. එහි අඳුරු කර ඇති කොටස පබළු වලින් ආවරණය කර ඇත.



i) පබළු වලින් ආවරණය වී ඇති කේන්ද්‍රික ඛණ්ඩයේ අරය සොයන්න. (ල. 01)

ii) පබළු නොමැති කොටස වටා පීත්ත පටියක් අල්ලයි නම් ඒ සඳහා අවශ්‍ය වන පීත්ත පටියේ අවම දිග සොයන්න. (ල. 03)

iii) පබළු අල්ලා ඇති කොටසේ වර්ගඵලය සොයන්න. (ල. 02)

iv) සැරසිල්ලෙහි කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය මෙන් දෙගුණයක වර්ගඵලයක් සහිත සෘජුකෝණී ත්‍රිකෝණාකාර කොටසක් AD එක් පාදයක් ද අනෙක් පාදය දික්කල BA ඔස්සේ ද වන ලෙස ඉහත සැරසිල්ලට එකතු කරයි නම් එහි දළ සටහන ඇඳ මිනුම් සටහන් කරන්න. (ල. 04)

මුළු ලකුණු 10

Past Papers Wiki

03. කමිස නිෂ්පාදනය කරන ආයතනයක් කමිස 2000 නිෂ්පාදනයට මිනිසුන් 20 දෙනෙකුට දින 5 ක් ගතවේයැයි ඇස්තමේන්තු කර ඇත.

i) කමිස 2000 නිෂ්පාදනය සඳහා අවශ්‍ය මිනිස් දින ගණන සොයන්න. (ල. 01)

ii) දින 2 ට පසු මිනිසුන් 5 දෙනෙකු වැඩට නොපැමිණියේ නම් ඉතිරි කමිස තොගය නිෂ්පාදනය කිරීම සඳහා ඉතිරි අයට අමතර දින කීයක් ගතවේද ? (ල. 03)

iii) කමිසයක් නිපදවීමට අවශ්‍ය රෙදි ප්‍රමාණය 1.5 m වේ. රෙදි මීටර් 1 ක ආනයනික මිල රු. 400 ක් වන අතර රෙදි ආනයනයේ දී 20% ක තීරු බදු ප්‍රතිශතයක් අයකෙරේ. ඉහත කමිස 2000 සඳහා අවශ්‍ය රෙදි තොගය ආනයනයේ දී ගෙවිය යුතු තීරු බදු මුදල සොයන්න. (ල. 04)

iv) කමිසයක් මිලදී ගැනීමේ දී පාරිභෝගිකයෙකුට 15% vat බද්දක් ගෙවීමට සිදුවේ. එම vat බදු මුදල රු. 450 ක් නම් vat බදු හැර කමිසයේ මිල සොයන්න. (ල. 02)


මුළු ලකුණු 10

---

04. (a) X නම් පෙට්ටියක් තුළ සුදු පැහැති පබළු 3 ක් W_1, W_2, W_3 ලෙස ද කළු පැහැති පබළු 2 ක් B_1, B_2 ලෙස ද ඇත. Y නම් පෙට්ටියක් තුළ සුදු පබළු 2 ක් W_4, W_5 ලෙස ද කළු පැහැති පබළු 3 ක් B_3, B_4, B_5 ලෙස ඇත.

i) X හා Y පෙට්ටි තුළින් පබළුවක් බැගින් ඉවතට ගැනීමේ සිද්ධියට අදාළ නියැදි අවකාශය කොටුදැල මත "×" යොදා සම්පූර්ණ කරන්න. (ල. 01)


ii) ඉවතට ගන්නා ලද පබළු දෙක එකම වර්ණයෙන් යුත් පබළු වීමේ සිද්ධිය වටකර දක්වා එහි සම්භාවිතාව සොයන්න. (ල. 04)



PAST PAPERS WIKI

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(b) i) අංක 1, 2, 3, 4, 5 යෙදූ කාඩ්පත් කට්ටලයක් බෑගයක් තුළ ඇත. ඉන් ඉවතට ගන්නා ලද කාඩ්පතක් ප්‍රථමක සංඛ්‍යාවක් වීම, නොවීම පරීක්ෂාකර නැවත බෑගයට දමා තවත් කාඩ්පතක් ඉවතට ගන්නා ලදී. මෙම සිද්ධියට අදාළ නියැදි අවකාශය පහත අසම්පූර්ණ රුක් සටහනෙහි දක්වන්න. (ල. 03)




ii) එක් අවස්ථාවකදීවත් ප්‍රථමක සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව සොයන්න. (ල. 02)

මුළු ලකුණු 10

---

05. එලවළු වවා ඇති ගෙවත්තක එක් එක් එලවළු වගාව සඳහා බිම් ප්‍රමාණ වෙන්කර ඇති ආකාරය පහත වට ප්‍රස්තාරයෙන් දැක්වේ.



i) අඩුම බිම් ප්‍රමාණයක වගා කර ඇති එලවළු වර්ගය කුමක්ද ? (ල. 01)

ii) කැරට් හා බීට්රූට් වගාකර ඇති බිම් ප්‍රමාණ අතර අනුපාතය සරල ලෙස දක්වන්න. (ල. 02)

iii) බීට්රූට් වගාකර ඇති කොටස ගෙවත්තේ මුළු බිම් ප්‍රමාණයෙන් කුමන භාගයක්ද ? (ල. 02)

iv) බෝංචි වගාකර ඇත්තේ $60\,m^2$ ක බිම් ප්‍රමාණයක නම් ගෙවත්තේ මුළු වර්ගඵලය සොයන්න. (ල. 03)

v) ගෙවත්තට යාබදව පිහිටි තවත් $60\,m^2$ ක බිම් කොටසක් මිලදීගෙන එම කොටසේ ද බෝංචි වගා කළේ නම්, වෙනස් වූ දත්ත අනුව ඇඳි නව වට ප්‍රස්තාරයේ බෝංචි වගාවට අනුරූප කේන්ද්‍රික කෝණය සොයන්න. (ල. 02)

මුළු ලකුණු 10

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	ගණිතය -II	කාලය நேரம் Time	පැය 03

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

අමතර කියවීම් කාලය මිනිත්තු 10

වැදගත් :
- ★ **A කොටසින් ප්‍රශ්න පහක් සහ B කොටසින් ප්‍රශ්න පහක් තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.**
- ★ **ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී අදාළ පියවර හා නිවැරදි ඒකක ලියා දක්වන්න.**
- ★ **සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.**
- ★ **අරය r ද උස h වූ ඍජු සිලින්ඩරයක පරිමාව $\pi r^2 h$ වන සූත්‍රයෙන් ලැබේ.**
- ★ **හරස්කඩ වර්ගඵලය A ද, දිග l ද වන ප්‍රිස්මයක පරිමාව Al වේ.**

A කොටස

★ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (a) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව එක්තරා වර්ෂයකදී ආදායම් බදු ගණනය කරන ආකාරය දැක්වෙන වගුවක කොටසක් පහත දක්වා ඇත.

	මුදල	බදු ප්‍රතිශතය
පළමු	500 000	බද්දෙන් නිදහස්
ඊළඟ	500 000	4%
ඊළඟ	500 000	8%
ඊළඟ	500 000	12%

එක්තරා ව්‍යාපාරිකයකු ඔහුගේ වාර්ෂික ආදායම සඳහා ආදායම් බදු මුදල ලෙස වර්ෂය අවසානයේ රුපියල් 53 600 ක් ගෙවයි නම් ඔහුගේ වාර්ෂික ආදායම ගණනය කරන්න.

(b) ඔහු ලැබූ ආදායමින් රු. 300 000 ක මුදලක් 14% ක සුළුපොලී අනුපාතිකයක් ගෙවන මූල්‍ය ආයතනයක වසර 2 ක් සඳහා තැන්පත් කරන ලද නම් වසර දෙක අවසානයේ ඔහුට ලබාගත හැකි මුළු මුදල සොයන්න.

---

02. $y = x^2 - 3$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීම සඳහා සකස් කරන ලද අසම්පූර්ණ අගය වගුව පහත දැක්වේ.

x	- 3	- 2	- 1	0	1	2	3
y	6	1	- 2	.....	- 2	1	6

i) $x = 0$ වන විට y හි අගය සොයන්න.

ii) x අක්ෂය හා y අක්ෂය දිගේ කුඩා බෙදුම් දහයකින් ඒකක එකක් නිරූපණය වන සේ පරිමාණය යොදාගනිමින් ප්‍රස්තාර කඩදාසියක ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

ප්‍රස්තාරය ඇසුරින්,


iii) ශ්‍රිතය ඍණව වැඩිවන x හි අගය පරාසය ලියන්න.

iv) $x^2 - 3 = 0$ සමීකරණයේ මූල ප්‍රස්තාරය ඇසුරින් සොයන්න.

v) ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය y අක්ෂය දිගේ ඉහළට ඒකක 2 ක් විස්ථාපනය කළ විට ලැබෙන ප්‍රස්තාරයේ සමීකරණය ලියා දක්වන්න.

Past Papers Wiki

03. (a) රූපයේ දැක්වෙන ABC සෘජුකෝණී ත්‍රිකෝණයේ වර්ගඵලය $10\ cm^2$ නම් x මගින් $x^2 + 5x - 14 = 0$ වර්ගජ සමීකරණය තෘප්ත කරන බව පෙන්වා AB පාදයේ දිග සොයන්න.



(b) සුළු කරන්න. $\frac{6}{x-2} - \frac{1}{2-x}$

---

04. එක්තරා පෞද්ගලික අධ්‍යාපන ආයතනයක ඉගෙනුම ලබන සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීමට පවත්වන ලද පරීක්ෂණයක දී ඒ සඳහා පෙනී සිටි 30 දෙනෙකු ලබාගත් ලකුණු පිළිබඳ තොරතුරු ඇතුළත් සංඛ්‍යාත වගුවක් පහත දැක්වේ. (මෙහි 10 - 20 යනු 10 හෝ ඊට වැඩි 20 ට අඩු යන්නයි.)

ලකුණු ප්‍රාන්තරය	0 - 10	10 - 20	20 - 30	30 - 40	40 - 50	50 - 60
ශිෂ්‍ය සංඛ්‍යාව	3	4	2	10	5	6

i) මෙහි මාත පන්තිය කුමක්ද ?

ii) මෙහි මධ්‍යස්ථ පන්තිය කුමක්ද ?

iii) මාත පන්තියේ මධ්‍ය අගය උපකල්පිත මධ්‍යන්‍ය ලෙස ගෙන හෝ අන්ක්‍රමයකින් මධ්‍යන්‍ය ලකුණ සොයන්න.

iv) වැඩිම ලකුණු ලබාගත් 20% ට විදෙස් රටක සංචාරයකට අවස්ථාව සැලසේ නම් ඒ සඳහා තෝරාගත යුතු සිසුන් සංඛ්‍යාව සහ අවම ලකුණ සොයන්න.

---

05. (a) හිස්වැසුමක මිල අත්පළඳනා 5 ක මිලට වඩා රුපියල් 80 ක් අඩුය. එමෙන්ම අත්පළඳනා 2 ක් සහ හිස්වැසුම් 4 ක මිල රුපියල් 1000 වේ.


i) අත්පළඳනාවක මිල රු. x ද, හිස්වැසුමක මිල රු. y ලෙස ගෙන ඉහත තොරතුරු දැක්වීමට සමගාමී සමීකරණයක් ගොඩනගන්න.

ii) එය විසඳීමෙන් අත්පළඳනාවක හා හිස්වැසුමක මිල සොයන්න.

(b) $h = \sqrt{2mn}$ හි m උක්ත කරන්න.

---

06. සමතලා පොළොවක පිහිටි AB සිරස් කුළුණකි. ඊට 20 m ක් දුරින් පිහිටි C ලක්ෂ්‍යයක් ද රූපයේ දැක්වේ. C සිට නිරීක්ෂණය කළ විට කුළුණ මුදුනෙහි වූ B හි ආරෝහණ කෝණය 50^0 කි. A සිට C පිහිටි දිශාවට C සිට 30 m ක් දුරින් වූ D ලක්ෂ්‍යයක සිට කුළුන මුදුන නිරීක්ෂණය කරනු ලැබේ.



i) ඉහත තොරතුරු දී ඇති රූපසටහන පිටපත් කරගෙන එහි ඇතුළත් කරන්න.
1 cm කින් 5 m ක් නිරූපණය වන සේ ඉහත තොරතුරු පරිමාණ රූපයක දක්වන්න.

ii) ඒ ඇසුරින් කුළුනේ උස ගණනය කරන්න.

iii) D සිට කුළුන මුදුනෙහි B හි ආරෝහණ කෝණය ලබාගන්න.

Past Papers Wiki

B කොටස

★ ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

07. බිත්ති සැරසිල්ලක පළමු පේළියේ ගිනිකුරු 2 ක් ද, ඉන්පසු සෑම පේළියකම පෙර පේළියට වඩා ගිනිකුරු 4 ක් වැඩි වන පරිදි රටාවක ආකාරයකින් සකසා ඇත.

i) මෙහි මුල් පද 4 ලියන්න.

ii) 12 වන පේළියේ ඇති ගිනිකුරු ගණන සොයන්න.

iii) n වන පේළියේ ඇති ගිනිකුරු ගණන දැක්වෙන ප්‍රකාශනය ලබාගන්න.

iv) ගිනිකුරු 58 ක් ඇත්තේ කීවන පේළියේද ?

v) මෙම රටාව 20 වන අවස්ථාව තෙක් සැකසීමට ගිනිකුරු 50 බැගින් ඇති පෙට්ටි 15 ක් ප්‍රමාණවත් නොවන බව පෙන්වන්න.

---

08. පහත දැක්වෙන නිර්මාණය සඳහා cm/ mm පරිමාණයක් සහිත සරල දාරයක් කවකටුවක් පමණක් භාවිතා කරන්න. නිර්මාණ රේඛා පැහැදිලිව දක්වන්න.

i) $AB = 8\,cm, A\hat{B}C = 60^0$ ද හා $BC = 6\,cm$ වන ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

ii) $B\hat{A}C$ කෝණයේ සමච්ඡේදකය නිර්මාණය කරන්න. එය BC පාදය හමුවන ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න.

iii) C සිට AB පාදයට ලම්බකයක් නිර්මාණය කර එය AB පාදය හමුවන ලක්ෂ්‍යය P ලෙස නම්කරන්න.

iv) O කේන්ද්‍රය ද, OP අරය වනසේ වෘත්තයක් නිර්මාණය කරන්න. එම වෘත්තයේ අරය මැන ලියන්න.

---

09. (a) අරය a වූ උස h වූ සිලින්ඩරයක් උණුකර ලෝහ අපතේ නොයන සේ හරස්කඩ වර්ගඵලය x ද, දිග a වූ ප්‍රිස්ම 2 ක් සාදනු ලැබේ නම් $x = \frac{\pi ah}{2}$ බව පෙන්වන්න.


(b) $\pi = 3.14$ ද, $a = 2.5\,cm$ ද, $h = 3\,cm$ නම් x හි අගය ලඝුගණක භාවිතයෙන් පළමු දශමස්ථානයට සොයන්න.

---

10. රූපයේ ABCD සමාන්තරාස්‍රයකි. ABE හා CDF සමපාද ත්‍රිකෝණ වන අතර AHF හා CGE සරල රේඛා වේ.


i) $AF = CE$ බව

ii) AHCG සමාන්තරාස්‍රයක් බව පෙන්වන්න.



PAST PAPERS WIKI

11. i) 100 දෙනෙකුගෙන් යුත් ක්‍රීඩා සමාජයකින් ලබාගත් තොරතුරු අනුව 42 (හතළිස් දෙදෙනෙකු)ක් ක්‍රිකට් ක්‍රීඩාව ද, 62 (හැට දෙදෙනෙකු) ක් පාපන්දු ක්‍රීඩාවේ ද නිරත වේ. ක්‍රිකට් පමණක් ක්‍රීඩා කරන පිරිස 26 කි. පහත වෙන් රූපය උත්තර පත්‍රයේ පිටපත් කරගෙන දී ඇති තොරතුරු ඇතුළත් කරන්න.




ii) ක්‍රිකට් හා පාපන්දු ක්‍රීඩා දෙකම ක්‍රීඩාකරන පිරිස කොපමණද ?

iii) මෙම ක්‍රීඩා සමාජයේ එක් ක්‍රීඩකයකු අහඹු ලෙස තෝරාගත් විට ක්‍රිකට් හෝ පාපන්දු ක්‍රීඩාවේ නිරත වන ක්‍රීඩකයකු වීමේ සම්භාවිතාව සොයන්න.

iv) පාපන්දු ක්‍රීඩාවට පමණක් කැමති පිරිස කුලක අංකනයෙන් ලියා දක්වන්න.

---

12. දී ඇති රූපයේ $A\hat{D}B = a$ නම් a ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු හේතු සහිතව ලියන්න.



i) $A\hat{C}B$ හි අගය සොයන්න.

ii) $A\hat{O}B$ හි අගය සොයන්න.

iii) $AB^2 + BC^2 = 4AO^2$ බව සාධනය කරන්න.

iv) $DE = EB$ නම් $AD = AB$ බව පෙන්වන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library